# 13 විරාම ලක්ෂණ

විරාමය යනු නැවතීම යි. ලේඛනයෙහි මෙන් ම කථනයෙහි විරාම යොදමින් අදහස් ඉදිරිපත් කිරීම මගින් නිරවුල් ව සහ පැහැදිලි ව තේරුම් ගැනීම පහසු කරයි. කථනයේ දී අංගචලනය, හඬ උස් පහත් කිරීම වැනි උපක්‍රම භාවිත කිරීමෙන් ස්වකීය අදහස් පහසුවෙන් අන් අයට වටහා දිය හැකි ය. කථනයේ දී භාවිත වන විරාමය දැක්වීම සඳහා ලේඛනයේ දී යොදා ගන්නේ විශේෂ සලකුණු කිහිපයකි. මේවා විරාම ලක්ෂණ ලෙස හැඳින්වේ.

කථනයේ දී තම අදහස් නිරවුල් ව, ප්‍රාණවත් ව ඉදිරිපත් කිරීමට යම් උපක්‍රම භාවිත කළ නමුත් ලේඛනයේ දී එවැනි සමහර උපක්‍රම භාවිත කළ නොහැකි ය. ලේඛකයා තමන්ගේ අදහස් නිරවුල් ව ප්‍රකාශ කිරීමේ දී යොදා ගන්නේ විශේෂ සලකුණු කිහිපයකි. විරාම ලකුණු ලෙස හඳුන්වන ඒවා යොදා ගැනීමෙන් ලේඛනය පැහැදිලි වන අතර එහි ඇතුළත් කරුණු පාඨකයාට අවබෝධ කර ගැනීමට ද පහසු ය.

උදාහරණයක් ;

- බසය පෙරළුණා.
- බසය පෙරළුණා?
- බසය පෙරළුණා!

ඉහත ප්‍රකාශ පුද්ගලයකු කථා ව්‍යවහාරයේ දී භාවිත කරන විට එහි උච්චාරණ ස්වරූපය අනුව අදහස තේරුම් යන නමුත් ලේඛනයේ දී ඒ සඳහා යොදා ඇති විරාම ලකුණු අනුව අදහස තේරුම් ගැනීම පහසු වේ.

**පහත සඳහන් වන්නේ රාහුල පොඩි හාමුදුරුවෝ ඇසළ පුන්පොහොය දින පෙහෙවස් සමාදන් වූ උවසු උවැසියන් සඳහා දේශනා කළ ධර්ම දේශනයෙන් කොටසකි.**

බණ අසන්නට සූදානම් වී සිටින සැදැහැවත් පින්වතුනි, අද මම මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ සීලවනාග ජාතකය යි. අපේ බෝසතාණන් වහන්සේ එක්තරා ආත්ම භාවයක ඇතෙක් වෙලා උපන්නා; හරිම සිල්වත්, ඒ නිසාම සීලවනාග කියලා නමකුත් වැටුණා. එක් දවසක් මේ ඇතා සිටිය වනයට එනවා දුව දඬු සොයාගෙන මනුස්සයෙක්. ඔහු කැලේ දුව දඬු සොයමින් යද්දී අතරමං වුණා. පාර හොයාගන්න බැරිව ඇවිදින කොට ඔහුට සීලවනාග ඇතා හමු වුණා. ඇතා ඔහුගෙන් කරුණු විමසුවා. ඇතාට ඔහු ගැන අනුකම්පා හිතිලා පිටේ තියාගෙන කැලයෙන් එළියට ගෙනාවා.

එළියට ගෙනවිත් පාර පෙන්නලා ගියා. අර මනුස්සයා ඇතා තමන්ට කළ උදව්ව ගැන නොසලකා පිටේ සිටිද්දී ම ඒ කැලේ සලකුණු මතක තියා ගත්තා. ඇයි දන්නව ද? පින්වත්නි, ඒ ඇතාට තිබුණා, දිගම දිග ඇත් දළ දෙකක්. පස්සේ ඇවිත් ඒ දළ දෙක කපාගෙන යන්න කියලා හිතාගෙන යි, ඔහු මග සලකුණු මතක තියා ගත්තේ.



ඉතින් මේ දුෂ්ට මිනිසා කැළයෙන් එළියට ඇවිත් දිගට ම ගියේ ඇත් දළ වැඩ කරන වීදියට. ජීවත් ව සිටින ඇතෙකුගේ දළ දෙකක් තිබෙනවා. එය ගෙනත් දෙන්න කීයක් දෙනවද කියලා ඒ වීදියේ මුදලාලි කෙනෙකුගෙන් ඔහු ඇහුවා. ජීව දන්ත නිසා වැඩි මිලක් දෙන බව මුදලාලි කීවා. නපුරු මිනිහා ඒක අහලා කියතකුත් අරගෙන කැළේට ගිහින් සීලවනාග ඇතා හමු වෙලා මෙහෙම කියනවා..................

"අනේ ! ඇත් රජුනි, මම හරිම දුප්පත්,
මට විකුණලා ජීවත් වෙන්න ඔය
දළ දෙක දෙනවද?" කියලා.

ඇතා කිසිම කතාවක් නැතිව බිම දිගාවී දළ දෙක කපාගෙන යන්න ඉඩ දුන්නා. කියතේ එක පැත්තකින් අර මිනිහා අල්ලාගෙන සිටිද්දී ඇතා තම හොඬෙන් අනිත් පැත්ත අල්ලාගෙන දළ කපන්න පවා උදව් කළා. මිනිහා ඒ දළ දෙක අරගෙන ගිහින් විකුණලා හොඳට කාලා බීලා ජීවත් වුණා. මේ මිනිසාගේ දුෂ්ටකම නිසාම ආයෙත් දවසක ඇතාගේ ඉතිරි දළ කොට දෙක කපාගන්නට කල්පනා කළා. එහෙම හිතලා මිනිහා සීලවනාග ඇතා ළඟට ඇවිත් මහා බොරුවක් කීවා.

"අනේ ඇත් රජුනි, එදා අරගෙන ගිය
දළ දෙක විකුණලා ණය ගෙව්වා විතරයි.
දැන් ජීවත් වෙන්න විදිහක් නෑ.
ඔබතුමාගේ ඉතිරි දළ කොට දෙක
දෙනව ද?".... කියලා ඇහුවා.

ඇත්තටම පිංවතුනි, කපන්න කියලා දළ දෙකක් නැහැ. ඒත් ඇතා මේ මිනිහා ගැන කරුණාවෙන් බිම නිදාගත්තා, කපන්න කියලා. මේ නපුරු මිනිහා ඇතාගේ හිස මත නැගලා විළුඹෙන් ඇනලා, ඇනලා ලේ පනිද්දි අර දළ කැළි දෙක කපා ගත්තා. ඇතාට හරිම වේදනාව යි. ඒත් ඉවසුවා. ඇතා මේ වේදනාවෙන් කෙඳිරි ගාද්දී හිසෙන් බැහැලා මිනිහා අර දළ කොට දෙකත් අරගෙන යන්න ගියා. හැබැයි පිංවතුනි, ඒ මිනිහාට වැඩි දුරක් යන්න ලැබුනේ නෑ. මිනිහාගේ තිබුණු නපුරුකම නිසාම පොළොව පළාගෙන නිරයට වැටුණා. ඒ බෝසත් ඇතා වේදනාව ඉවසගන්න බැරුව මියැදුණා. ඉතින්

පිංවතුනි, ඒ නපුරු මිනිසා වෙන කවුරුත් නෙවේ, අපේ බුදුන්වහන්සේගේ කාලයේ දේවදත්ත වෙලා ඉපදුණේ එයා තමයි. මේ ජාතක කතාවෙන් අප කාටත් කියලා දෙන්නේ කළගුණ නොසලකන නපුරු ගති ඇති අය දුගතිවල ඉපදෙන බව යි.

ධර්ම දේශනාව අවසානයේ ඊට සවන් දුන් උපාසිකාවන් දෙදෙනෙකු රාහුල පොඩිහාමුදුරුවන්ගේ හැකියාවන් ගැන කතා බහක යෙදුණේ මෙසේ ය.

බිසෝහාමි :- "රාහුල පොඩි හාමුදුරුවන්ගේ බණකතාව නම් හරිම අපූරුයි".

යසෝහාමි :- "උන්වහන්සේ බණකතාව කියපු විදිහ නම් දුකේ බෑ..... අහගෙන ඉන්න ආසයි.

බිසෝහාමි :- "මං බලාගෙන, සමහර අයගේ ඇස්වලට කඳුළු ආවා. මගේ ඇස්වලටත් කඳුළු ආවා".

යසෝහාමි :- අර ඇත්දළ කොට දෙක කපපු එක ගැන කියනකොට නම් කාට ද ඇඬෙන්නේ නැත්තේ"?

බිසෝහාමි :- "ඇත්තට ම බණකතාව පැහැදිලි කරපු හැටි. අම්මපා පොඩි ළමයකුටත් තේරෙනවා. උන්වහන්සේගේ කටහඬත් කෙනෙකුට අහගෙන ඉන්න හරිම අපූරුයි"

යසෝහාමි :- එන මාසේ අපේ අම්මගේ අවුරුද්දේ පිංකමටත් බණට උන්වහන්සේට ආරාධනා කරන්ට ඕන".

බිසෝහාමි :- කවද හරි අපේ පිරිවෙනේ රාහුල පොඩිහාමුදුරුවෝ හොඳ ප්‍රසිද්ධ පණ්ඩිත හාමුදුරුනමක් වෙයි කියලා මට හිතෙනවා යසෝ.

බිසෝහාමිටත්, යසෝහාමිටත් රාහුල පොඩි හාමුදුරුවන්ගේ බණකතාව පිළිබඳ ව මෙතරම් පැහැදීමක් ඇති වූයේ කුමක් නිසා ද? සීලවනාග ජාතක කතාවේ කථා පුවතට අමතර ව උන්වහන්සේගේ කථා විලාසය, හඬ උස් පහත් කිරීම, වාක්‍ය අතරතුර විරාම තබමින් අර්ථය ඉස්මතු වන සේ වචන හැසිරවීම, අංගචලනය වැනි උපක්‍රම භාවිත කිරීමට රාහුල හිමියන් සතු වූ හැකියාව යනාදිය බව පැහැදිලි ය. කථාව කෙතරම් සිත්ගන්නාසුලු වුවත්, ඊට ජීව ගුණයක් එකතු වන්නේ ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා සුදුසු උපක්‍රම භාවිත කරන්නේ නම් පමණි.

**විරාම ලකුණු හඳුනාගනිමු**

| | |
|---|---|
| නැවතීමේ ලකුණ | = . |
| කොමාව | = , |
| තිත් කොමාව | = ; |
| වරහන් | = ( ) |
| උද්ධෘතය | = " " |

අප හඳුනා ගත් විරාම ලක්ෂණ පහ වන කොමාව, තිත් කොමාව, වරහන්, උද්ධෘතය, නැවතීමේ ලකුණ පහත සඳහන් වාක්‍යවල යොදා ඇති ආකාරය බලන්න.

- අනුරාධපුරය, දඹදෙණිය, නාගසේන, අනුලා, ආදි පද සංඥා නාම පද ලෙස හඳුන්වයි.
- ඒ කවිය මිහිරි ය; අර්ථවත් ය; ගීතවත් ය; සිත් ගන්නාසුලු ය.
- පළමු වන විජයබාහු රජතුමා ජම්බුකෝල පට්ටන (දඹකොළ පටුන) විහාරය ප්‍රතිසංස්කරණය කළ බව වංශකථාවල සඳහන් වේ.
- අම්මා වෙත ලියූ ලිපියේ "මම හෙට ගෙදර එමි" යි සිරිපාල සඳහන් කර තිබුණි.

**විරාම ලකුණු යොදන ආකාරය හඳුනා ගනිමු.**

**තිත (.)**

- නැවතීමේ ලකුණ හෙවත් සමාප්ති ලකුණ.
- වාක්‍යයක අවසානය දැක්වීම සඳහා යෙදේ.
- නාමයක් කෙටිකර දැක්වීමේ දී යෙදේ.

උදා :- ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (ලං.දු.දෙ.)
පෙරවරු (පෙ.ව.)

- අවුරුදු මාස ආදිය දැක්වීමේ දී යෙදේ.

උදා :- 1995.05.17

**කොමාව ( , )**

- මඳ විරාමයක් දැක්වීමේ දී වාක්‍යයක කොටසක් අතර යොදන සලකුණකි.

උදා :- මොළය, රුධිරය, ආමාශය ආදි ශරීර අවයව ගැන සලකා බලන කල, මිනිසා හා චිම්පන්සියා අතර වෙනස්කම් ඇත.

- එකිනෙක හා සම්බන්ධ වන කරුණු දැක්වීමේ දී ද කොමාව යෙදේ.

උදා :- රජතුමාගේ උයන රතු, කහ, සුදු වර්ණ සහිත මල්වලින් පිරී තිබුණි.

උදා :- ඇ මහත් ශෝකයෙන් සිටින බව සුදුමැළි වූ ඇගේ මුහුණේ පෙනුමෙන් ද, ඇ නිශ්ශබ්ද ව සිටීමෙන් ද, මට වැටහිණ.

- ආමන්ත්‍රණ පදයක් සමග අන්‍ය පද වෙන් කිරීමේ දී කොමාව යෙදේ.

උදා :- මගිය, මා කියන්නක් කරව.

## තිත් කොමාව ( ; )

- කොමාවට වඩා දීර්ඝ විරාමයක් පෙන්වීමට අවශ්‍ය ස්ථානවල දී යෙදේ.

  උදා:- නළගන රඟුමෙන් රජු සතුටින් පිනා ගියේ ය; මහ හඬින් සිනාසුණේ ය; නාටිකාංගනාවන්ට තෑගි බෝග දුන්නේ ය.

- ඉදිරි ප්‍රකාශන හා පවතින සම්බන්ධය දැක්වීමේ දී යෙදේ.

  උදා:- පොඩි හාමුදුරුවන්ගේ ධර්ම දේශනාව මිහිරි ය; අගනේ ය.

## වරහන් ( )

- වෙන් කර දැක්වීමේ දී, අදහසක් වඩා පැහැදිලි කිරීමක දී, මෙම විරාමය යොදා ගනී. උදා:- වාක්‍යයක අවසාන ක්‍රියාවෙන් කියවෙන (උක්ත පද) පදය ප්‍රථමා විභක්ති ගනියි.

  සය වන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව 1415   1467) කෝට්ටේ යුගයේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි.

## උද්ධෘත පාඨ ලක්ෂණය ( " " )

- පෙරළි කොමා ලෙස ද හඳුන්වන මෙම සලකුණ මුඛ පාඨ, උද්ධෘත පාඨ, විශේෂ ව්‍යවහාර යොදන අවස්ථාවල දී භාවිත කරන විරාම ලකුණකි.

  උදා :- "දරුවන් මෙහෙට ගෙදර එති'යි මව්පියෝ බලා සිටිති''.

  "වෛරයෙන් වෛරය නොසංසිඳේ" යනු බුද්ධ වචනයකි.

  ශ්‍රී ලංකාව " ඉන්දියන් සාගරයේ මුතු ඇටයකි " යන්න බොහෝ දෙනාගේ අදහසකි.

**ක්‍රියාකාරකම 13.1**

i. පහත සඳහන් වාක්‍ය ඔබ උගත් විරාම ලකුණු යොදමින් නැවත ලියන්න.

අ) නංගිගේ ගවුම සුදු නිල් රතු වර්ණවලින් යුත් අලංකාර මල්වලින් පිරී තිබුණි

ආ) යසෝහාමි උපාසක මාතාව සිල්වත් ය ගුණවත් ය නැණවත් ය

ඇ) දේවානම්පියතිස්ස රජුගේ රාජ්‍ය කාලය තුළ බුදුදහම මෙරටට ගෙන ආ බව මහාවංශයේ සඳහන් ය

ඈ) අහසින් වැටෙන එක දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන අපතේ නොහරිම් මහපැරකුම්බා රජුගේ උදාර ප්‍රකාශයකි

ඉ) පිංවතුනි බණ ඇසීමට පෙරාතුව පන්සිල් සමාදන් වීමට නමස්කාරය කියන්න

**ක්‍රියාකාරකම 13.2**

පහත දක්වා ඇති විරාම ලකුණු යොදා අර්ථවත් වාක්‍ය සාදන්න.

i) .
ii) ,
iii) ;
iv) ( )
v) " "

**ක්‍රියාකාරකම 13.3**

පහත සඳහන් එක් එක් වාක්‍යයේ යොදා ඇති විරාම ලක්ෂණ නම් කර එම සංකේතයෙන් අර්ථවත් වන දෑ පැහැදිලි කරන්න.

i) මාර්ටින් වික්‍රමසිංහ "දක්ෂ ලේඛකයෙකි" යන්න බොහෝ දෙනා ගේ අදහස කි.
ii) මඩොල්දූව, ගම්පෙරලිය, කලියුගය, විරාගය, යුගාන්තය ආදිය මාර්ටින් වික්‍රමසිංහ මහතා ලියූ නවකතා ය.
iii) අග්නි පූජාව (ගිනි පිදීම) භාරත සමාජයේ පැවති පූජා විධියකි.
iv) ගුරුතුමා පන්තියට පැමිණියේ ය; පාඩමට සූදානම් විය; සිසුන්ගේ දැනුම පරීක්ෂා කළේ ය; රසවත් පාඩමක් ඉගැන්වූයේ ය.